# පුංචි යසසි



පි.ඩී.අයි සමන්ති



# පුංචි යසසි

© පි.ඩී.අයි සමන්ති

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය : 2025 පෙබරවාරි

ISBN 978-624-208-899-0

කතෘ : පි.ඩී.අයි සමන්ති

පරිගණක අක්ෂර

සහ චිත්‍ර නිර්මාණය : ෂලෝමි පෙරේරා

# පිදුම

අද මා ළඟ නොසිටියත් මගේ ජිවිතේ හැම අවස්ථාවකදීම මා ළඟින් සිට මා දිරි ගැන්වූ මගේ ආදර ස්වාමියා සිහිපත් කරමින්,

මගේ සෙවනැල්ල මෙන් සිටින මගේම ආදර දරු තිදෙනාට පුදමි මෙය ආදරයෙන්.

# ස්තූතිය

‘‘අක්කා ඔයාට පුළුවන් යැයි කියා’’ නිරතුරු මා පසුපස සිටිමින්, හැම උපදෙසක්ම දෙමින් මෙම පොත එළි දක්වන්නට මා දිරි ගැන්වූ ආදරණීය තුෂාරි දේවසුරේන්ද්‍ර මිතුරියට හා මෙම කතාව අකුරු කරන්නට හා අලංකාරවත් චිත්‍ර වලින් වර්ණවත් කරදුන් මගේ ආදරණීය ලේලිය ෂලෝමි පෙරේරා දියණියටද ආදර ලොකු පුතාටද මගේ හදපිරි ස්තූතිය පිරි නමමි.

# පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධන සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්ශනශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානිත වූ ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වූ භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ. ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍ය වෙයි. ඔහු තුල මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරහා සිදුකිරීම වඩාත් පලදායි වෙයි.

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි .

මෙවර අප පාසලේ ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස, අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “ හෙරණගත්කරණි ” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය .

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට

ආදර්ශයක් දෙමින් නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් වීම ප්‍රශංසනීය කරුණකි. ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

‘යසසි’ හරිම ලස්සන පුංචි බබෙක්. එයා හැම තිස්සෙම හිනහ වෙලා සතුටින් තමයි ඉන්නේ.



පුංචි යසසි අම්මට තාත්තට, එයාගේ යාළුවන්ට වගේම, සතුන්ට,ගස්වලට හා මල්වලට ගොඩක් ආදරේ කළා. කවදාවත් කාටවත් කරදර කළේ නැහැ.



දවසක් පුංචි යසසි ගෙදර වත්තේ තනියම හිනහා වෙවී කතා කර කර ඉන්නවා අම්ම දැක්කා.



“චුටි දුව.... ඔයා ඔතන මොකද කරන්නේ තනියම” “ඔයා කවුරු එක්කද කතා කරන්නේ හිනහා වෙන්නේ”... අම්මා යසසිගෙන් ඇහුවා.



“ මේ බලන්න අම්මා ලස්සන සමනලයෝ මල්වල පැණි බොනවා. “මම කතා කළේ ඒගොල්ලන්ට”

අම්මා ආදරෙන් යසසිගේ ඔලුව අතගෑවා.



එතකොටම අම්මට ඇහුණා ලස්සන කටහඬක්. “යසසි හරිම හොඳ කරුණාවන්ත බබෙක්. අපි එයාව හැමදාමත් ආදරෙන් බලා ගන්නවා”



“කව්ද ඒ ?”... අම්මා වටපිට බැලුවා

ලස්සනම ලස්සන සමනල් රැනක්, අම්මයි, යසසි බබාගෙයි වටේ කැරකිලා අහසේ ඉහළටම රිදී පාටට පියඹා නොපෙනී ගියා.



# පසුවදන

රටක අනාගතය සදහා මානව සම්පත සූදානම් කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය. එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය. ඔවුන් සමාජයේ පෙරමග කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයන් වීම ද අත්‍යවශ්‍ය වෙයි. තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි.

මෙම යථාර්තය පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොටගත් දරුවන් දහස් ගණනක්, දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කරු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය. ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘතිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමටද වේදිකාවක් සකසා දීමට ලැබීම භාග්‍යයකි. මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමග පොත් ලියන " හෙරණගත්කරණී" ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුන්ටද ආදර්ශයකි .

ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්

හෙරණගත්කරණී නිර්මාතෘ

සෙනෙවිරත්න මහලේකම්

2025. 02. 08